## ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය 2013

ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලයේ 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යය සාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරු වල සාරාංශයකින් සමන්විත 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1973 අංක 5 දරන ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩල පනතේ 20 වන වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර මණ්ඩලයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමණාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමණාකරණයේ වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකිම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිත අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත්වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවධානම් තක්සේරු කිරීම විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවධානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත

විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් මණ්ඩලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමණාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවැරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 <u>තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම</u>

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුමත පදනම්ව මාගේ මතය තත්ත්වාගණන කරනු ලැබේ.

## 2. <u>මූල්‍ය ප්‍රකාශන</u>

## 2.1 <u>විගණන මතය</u>

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2013 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම් ප්‍රමිතවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 2.2 <u>මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම</u>

### 2.2.1 <u>ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත</u>

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මණ්ඩලය විසින් භාවිතා කරනු ලබන ත්‍රීරෝද රථයේ සුන්බුන් වටිනාකම 2013 දෙසැම්බර් 31 දිනට රු.13,500 ක් ලෙස අවසන් ගිණුම්වල දක්වා තිබුණද දැනට භාවිතා කරමින් පවතින එම රථය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම් ප්‍රමිත අංක 7 අනුව, නැවත ප්‍රත්‍යාගණනය කර, ප්‍රත්‍යාගණනය කරන ලද වටිනාකම ගිණුම්වලට ඇතුලත් කර නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම් ප්‍රමිත අංක 7 අනුව, ස්ථාවර වත්කම් ප්‍රයෝජනවත් තත්වයට පත්කළ දින සිට ක්ෂය කල යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේ අවස්ථා කිහිපයකදී මිලදී ගන්නා ලද රු.285,500 ක් වූ ස්ථාවර වත්කම් 2013 වර්ෂය සඳහාම ක්ෂය කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ක්ෂය වියදම රු.47,708 ක් වැඩියෙන් දක්වා තිබුණි.

**2.2.2 <u>ගිණුම්කරණ අඩුපාඩු</u>**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව පුවත්පත් කලා සමීක්ෂා පොත් තොගයෙහි වටිනාකම රු.15,250 ක් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණි.

(ආ) පුවත්පත් කියවීම පිළිබඳ ග්‍රාහක සමීක්ෂණය සඳහා ගෙවිය යුතුව තිබුණු රු.343,800 ක මුදල ගිණුම් වලට ගෙන නොතිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ඌනතාවය සමාන ප්‍රමාණයකින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) 2012 වර්ෂයේ දී වාහන නඩත්තු වියදම් වෙනුවෙන් ගෙවා තිබුණු රු.44,180 ක මුදල ස්ථාවර වත්කම් ලෙස ගිණුම්ගත කර තිබීම, සමාලෝචිත වර්ෂය තුළදී ද නිවැරදි කර නොතිබුණි.

(ඈ) සුන්බුන් අගය අඩුකළ පසු පිරිවැය වූ රු.125,216 ක් වූ පුස්තකාල පොත්වල වටිනාකම මණ්ඩලයේ ක්ෂය ප්‍රතිපත්තියට අනුව සමාලෝචිත වර්ෂය තුළදී ක්ෂය කර නොතිබුණි. මේ අනුව සමාලෝචිත වර්ෂයේ ක්ෂය වියදම රු.25,043 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණි.

**2.3 <u>නීති, රීති, රෙගුලාසි හා කළමණාකරණ තීරණවලට අනුකූල නොවීම</u>**

2010 මැයි 14 දිනැති අංක සීජ්/1/17/1 දරන ජනාධිපති ලේකම්ගේ ලිපිය ප්‍රකාරව කටයුතු නොකිරීම පිළිබඳ 2012 ජූලි 10 දින පැවති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේදී සාකච්ඡා විය. මණ්ඩලයේ කාර්යාල පරිශ්‍රය රජයේ ගොඩනැගිල්ලක් වෙත ගෙන යැමට නියෝග කර තිබුණ ද, මණ්ඩලය ඒ අනුව කටයුතු කර නොතිබුණි. එසේම ආයතනය ආරම්භ වී වසර 40 ක් ගතවී තිබුණද, විවිධ ස්ථානවල කුලී පදනම මත කාර්යාලය පවත්වා තිබුණි. 2006 සිට 2013 වර්ෂය දක්වා පමණක් කුලී වශයෙන් රු.9,410,500 ක් වැය කර තිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මණ්ඩලයේ වැඩකටයුතු වල මූල්‍ය ප්‍රතිඵලය පුනරාවර්තන වියදම් සඳහා රජයේ ප්‍රදානය ගණන් ගැනීමට පෙර රු.20,778,955 ක ඌණතාවයක් වූ අතර, පුනරාවර්තන වියදම් සඳහා රජයෙන් ලැබුණු රු.18,983,750 ක ප්‍රදානයෙන් අනතුරුව එය රු.1,795,205 ක ඌණතාවයක් විය. ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය පුනරාවර්තන වියදම් සඳහා රජයේ ප්‍රදානය ගණන් ගැනීමට පෙර රු.16,680,648 ක ඌණතාවයක් වූ අතර, පුනරාවර්තන වියදම් සඳහා රජයෙන් ලැබුණු රු.16,601,000 ක ප්‍රදානයෙන් අනතුරුව එය රු.79,648 ක ඌණතාවයක් විය. සමාලෝචිත වර්ෂයේ රජයේ ප්‍රදානය රු.2,382,750 කින් වැඩි වී තිබුණද මණ්ඩලයේ සමස්ථ වියදම රු.3,832,123 කින් වැඩි වීම සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය පිරිහීමට හේතු වී තිබුණි.

### 3.2 වියදම් වල අසාමාන්‍ය වැඩි වීම.

වැඩමුළු, පාඨමාලා හා වෙනත් වැඩසටහන් සඳහා දැරූ සමස්ථ වියදම පසුගිය වසරට සාපේක්ෂව සියයට 94 කින් වැඩි වී තිබුණි. පසුගිය වසරට සාපේක්ෂව දැයට කිරුළ වැඩසටහන සඳහා රු.582,832 ක් වැඩිපුර වැය දරා තිබීම සහ මණ්ඩලයේ 40 වන සංවත්සරය වෙනුවෙන් රු.2,169,110 ක පිරිවැයක් දරා තිබීම මෙකී වියදම් වැඩි වීමට මූලිකව බලපා තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්ය සාධනය

සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම හා සැසඳීමේදී ක්‍රියාත්මක කරන ලද කාර්යයන්වල භෞතික හා මූල්‍ය ප්‍රගතිය පහත පරිදි වේ.

| ක්‍රියාකාරකම | සැලසුම් කල | | ප්‍රගතිය | |
|---|---|---|---|---|
| | ඉලක්කය | මූල්‍ය ප්‍රතිපාදනය රු. | තත්‍ය | මූල්‍ය |
| පැමිණිලි විභාග කිරීම | 75 | - | 38 | - |
| පුවත්පත් ලියාපදිංචි කිරීම | 200 | - | 189 | - |
| වෙබ් අඩවි ලියාපදිංචි කිරීම | 50 | - | - | - |
| වැඩමුළු හා සම්මන්ත්‍රණ පැවැත්වීම | 12 | 1,000,000 | 8 | 1,439,567 |
| ඩිප්ලෝමා පාඨමාලා පැවැත්වීම | 01 | 750,000 | 01 | 466,554 |
| වෘත්තීය මාධ්‍යවේදී වැඩමුළු | 02 | - | - | - |
| ග්‍රන්ථ මුද්‍රණය - මාධ්‍ය සමීක්ෂා II (පිටපත් 100) | 01 | 500,000 | 01 | 265,625 |
| - සන්නිවේදන විවිධාංග | 05 | - | - | - |
| පුවත්පත් කියවීම පිළිබඳ සමීක්ෂණය | 01 | 1,000,000 | - | 553,200 |

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය තුලදී ප්‍රවෘත්ති පත්‍ර වලට විරුද්ධව පැමිණිලි 61 ක් ලැබී තිබුණු අතර 2012 වර්ෂයේ නොවිසඳී තිබුණු පැමිණිලි 21 ක්ද සමඟ විසඳීමට පැමිණිලි 82 ක් තිබුණු අතර, ඉන් පැමිණිලි 24 ක් 2014 මැයි 25 දින දක්වාම විසඳා නොතිබුණි.

(ආ) වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව, දිස්ත්‍රික් ප්‍රාදේශීය මාධ්‍යවේදී හා පාසල් ජනමාධ්‍යවේදී වැඩමුළු 12 ක් පැවැත්වීම සඳහා රු.1,000,000 ක ප්‍රතිපාදන ලබාදී තිබුණි. එසේ වුවත්, වැඩසටහන් 8 ක් පමණක් පවත්වා ඒ සඳහා රු.1,439,567 ක් වැය කර තිබුණි.

(ඇ) වෙබ් අඩවි (Web Site) 50 ක් ලියාපදිංචි කිරීමට සැලසුම් කර තිබුණද 2014 අප්‍රේල් මාසය දක්වාම මෙම වැඩසටහන ක්‍රියාත්මක කර නොතිබුණි.

(ඈ) වඩා උසස් වෘත්තිය ජනමාධ්‍යවේදයක් ඇති කිරීම සඳහා සන්නිවේදන ග්‍රන්ථ විවිධාංග 05 ක් මුද්‍රණය කිරීමට සැලසුම් කර තිබුණද එය ඉටු කර නොතිබුණි.

## 4.2 කළමණාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පුවත්පත් මණ්ඩලය විසින් 2010 වර්ෂයේ සිට ජනසන්නිවේදන ඩිප්ලොමා පාඨමාලා තුනක් හා ඉංග්‍රීසි සහතික පත්‍ර පාඨමාලාවක් පවත්වා තිබුණු අතර, ඒ ආශ්‍රිතව පහත කළමණාකරණ දුර්වලතාවයන් දක්නට ලැබුණි.

(i) පාඨමාලා හතර සඳහා දරන ලද මුළු වියදම රු.2,449,997 ක් විය. එසේ වුවත්, පාඨමාලා සඳහා අය කර තිබුණු මුළු ගාස්තුව රු.834,500 ක් වූයෙන් මණ්ඩලයේ අරමුදලින් රු.1,615,497 ක අතිරේක පිරිවැයක් දැරීමට සිදු වී තිබුණි.

(ii) 2011 වර්ෂය තුළ පවත්වන ලද ඉංග්‍රීසි සහතික පත්‍ර පාඨමාලාවේ සහභාගිකයන්ගෙන් අයවිය යුතුව තිබුණු සම්පූර්ණ පාඨමාලා ගාස්තුව වන රු.525,000 ක මුදලින් රු.82,500 ක් පමණක් අයවී තිබුණු අතර, ඒ වෙනුවෙන් දරන ලද වියදම රු.222,188 ක් විය. සහභාගිකයන් අතුරින් සියයට 95 ක්ම වෘත්තීය මාධ්‍යවේදීන් විය. එසේම මෙම මුදල් අයකර ගැනීමේ ක්‍රමවේදයක් පාඨමාලාව ආරම්භයේදීම ඇතිකර නොතිබුණි.

(iii) 2011 / 2012 අධ්‍යයන වර්ෂය සඳහා ආරම්භ කරන ලද ජනමාධ්‍ය ඩිප්ලෝමා පාඨමාලාවේ ගාස්තු ලෙස දළ වශයෙන් රු.600,000 ක් අයවිය යුතු වුවද, රු.268,000 ක් පමණක් අයකරගෙන තිබුණි.

(iv) 2012 නොවැම්බර් 05 දින විගණන හා කළමණාකරණ කමිටු රැස්වීමේදී දුන් උපදෙස් අනුව පාඨමාලා වියදම් පියවා ගැනීමට හැකි වන පරිදි ගාස්තු සංශෝධනය කර තිබුණද එයින් පාඨමාලා සඳහා යන වියදම ආවරණය වී නොතිබුණි.

(v) ඉහත පරිදි පාඨමාලාව සඳහා සිසුන් ලියාපදිංචි වුවද පාඨමාලාව හැර යාමේ ප්‍රතිශතය සියයට 50 ක් පමණ විය. පාඨමාලා හැර යාමේ ප්‍රතිශතය වැඩි වීමට හේතුව කුමක්ද යන්න පිළිබඳ පසු විපරම් කර ඒ සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට පාඨමාලා සංවිධායකයන් විසින් කටයුතු කර නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය ආරම්භ කර වසර 40 ක් පිරීම නිමිත්තෙන් 2013 සැප්තැම්බර් 23 දින රු.2,169,110 ක වියදමක් දරා උත්සවයක් පවත්වා තිබුණි. මෙම වැඩසටහන සඳහා රු.1,750,000 ක ප්‍රතිපාදන වෙන්කර තිබුණු නමුත් ප්‍රතිපාදන ඉක්මවා රු.419,110 ක වියදමක් දරා තිබුණු අතර මණ්ඩලයට නව නිළධාරීන් බඳවා ගෙන ඔවුන්ට වැටුප් ගෙවීම සඳහා ලබාදී තිබුණු ප්‍රතිපාදන, නව නිළධාරීන් බඳවා ගැනීම ප්‍රමාද වූ බැවින් මෙම වැඩසටහන සඳහා යොදාවා තිබුණි.

(ඇ) 2012 සහ 2013 වර්ෂවලදී පාසල් ජනමාධ්‍ය වැඩමුළු 6 ක් පවත්වා තිබූ අතර, මින් 2012 වර්ෂයේදී පැවැත්වූ වැඩමුළු 3 න් 2 ක්ද, 2013 වසරේ පැවැත්වූ වැඩමුළු 3 න් 1 ක්ද වශයෙන් වැඩමුළු 6 න් 3 ක්ම මහනුවර දිස්ත්‍රික්කයේ පමණක් පවත්වා තිබුණි. මේ අනුව වැඩමුළු පැවැත්වීමේදී ලියාපදිංචි පාසල් ජනමාධ්‍ය සංගම් ඇති අනෙකුත් පාසල් කෙරෙහි කළමණාකරනයේ අවධානය යොමු වී නොතිබුණු බව විගණනයේදී නිරීක්ෂණය විය.

(ඈ) ආයතනය විසින් ජනමාධ්‍යයට සම්බන්ධ පොත්පත් මුද්‍රණය කර අලෙවි කරනු ලබන අතර, 2010 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා වරින් වර මුද්‍රණය කරන ලද පොත් 9 කින් පිටපත් 4,141 ක් අලෙවි නොවීම නිසා ගබඩා කර තිබුණි. මෙම පොත්වල මුළු පිරිවැය රු.530,668 ක් වූ අතර පොත්වල අලෙවි වටිනාකම රු.723,950 ක් විය. මුද්‍රිත පොත්පත් අලෙවි කිරීමට සහ බෙදා හැරීමට නිසි වැඩපිළිවෙළක් නොවීම මෙම තත්ත්වයට හේතු වී තිබුණි.

## 4.3 <u>මතභේදයට තුඩුදෙන ගනුදෙනු</u>

2013 වර්ෂයේදී මුද්‍රණය කරන ලද මාධ්‍ය සමීක්ෂා II ග්‍රන්ථයේ අක්ෂර සංයෝජනය කිරීම වෙනුවෙන් පෞද්ගලික ආයතනයක් වෙත රු.20,625 ක් ගෙවීම් කර තිබුණු අතර, අදාල චෙක්පත එම ආයතනයේ නමින් නිකුත් නොකර, පුවත්පත් කොමසාරිස් නමට නිකුත් කර තිබුණි. එසේම මෙම ගෙවීම සඳහා වූ ලදුපතේ මුල් පිටපත වෙනුවට ඡායා පිටපතක් විගණනයට ඉදිරිපත් කර තිබුණි.

## 4.4 <u>ආර්ථික නොවූ ගණුදෙණු.</u>

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මණ්ඩලයට අයත් මෝටර් රථයක තිබුණු ආසන ඉවත් කර අළුතින් ආසන සවි කිරීම සඳහා 2013 මාර්තු 17 දින මිල ගණන් කැඳවා තිබුණු අතර, එහිදී සේවාව සැපයූ ආයතනය විසින්ම ඉවත් කරන ආසන රු.20,000 ත් 25,000 ත් අතර මුදලකට මිලට ගැනීමට එකඟ වී තිබියදීත්, එම ඉවත් කළ ආසන වෙනත් බාහිර පුද්ගලයකු වෙත රු.10,000 ක මුදලකට අලෙවි කර තිබුණි.

(ආ) මණ්ඩලය විසින් ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් වලදී ඊට අදාල මුද්‍රණ කටයුතු සඳහා වෙනමම මිල ගණන් කැඳවීමකින් තොරව සංවිධාන කටයුතු කරන ලද ආයතන හරහා මුද්‍රණ කටයුතු සිදුකර ඒ සඳහා රු.318,500 ක් වැය කර තිබුණි.

**4.5** <u>කාර්ය මණ්ඩල පරිපාලනය</u>

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පුවත්පත් මණ්ඩල පනතේ 22 වගන්තිය ප්‍රකාරව එහි විධායක නිළධාරියා වූ පුවත්පත් කොමසාරිස් තනතුරේ කටයුතු 2010 මාර්තු 31 දින සිට අමාත්‍ය මණ්ඩලයේ උපදෙස් අනුව පත් කරනු ලැබූ නිළධාරීන් විසින් වැඩ බැලීමේ පදනම මත ආවරණය කර තිබුණි. පූර්ණ කාලීන නිළධාරියෙකු පත් කළ යුතු මෙම තනතුර සඳහා ස්ථිරව පුද්ගලයෙකු පත් කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීම පිණිස අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කරන ලෙස 2012 ජූලි 10 දින පැවති පොදු ව්‍යාපාර කාරක සභාවේදී නියම කරනු ලැබුවද, මෙම වාර්තාවේ දිනය දක්වාම අදාළ අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) 2006 සැප්තැම්බර් 02 දිනැති අංක 30 දරන කළමණාකරණ සේවා චක්‍රලේඛය ප්‍රකාරව මණ්ඩලයේ බඳවා ගැනීම් හා උසස් කිරීමේ පරිපාටිය 2013 අගෝස්තු 27 දින අනුමත කර තිබුණු අතර, නව නිළධාරීන් සඳහා වැටුප් ගෙවීමට ප්‍රතිපාදන ද මහා භාණ්ඩාගාරයෙන් අනුමත කර තිබුණි. එසේම 2013 ඔක්තෝබර් 06 දින මණ්ඩලයේ ඇබැර්තු 09 ක් සඳහා නිළධාරීන් බඳවා ගැනීමට පුවත්පත් දැන්වීමක් රු.102,144 ක් වැය කර පලකර තිබුණි. එසේ වුවත් අදාළ පුරප්පාඩුවලින් සහකාර කොමසාරිස් තනතුරු 01 ක් සඳහා පමණක් ද්විතීය පදනම මත නිළධාරියකු බඳවාගෙන තිබුණු අතර අනුමත කාර්ය මණ්ඩලය බඳවා නොගැනීම හේතුවෙන් දෛනික ගෙවීමේ පදනම මත 04 දෙනෙකු බඳවා ගෙන සමාලෝචිත වර්ෂය තුලදී වැටුප් ලෙස රු.475,305 ක් ගෙවා තිබුණි.

**5.** <u>ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය</u>

**5.1** <u>සංයුක්ත සැලැස්ම</u>

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී / 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍ර ලේඛයේ 5 වගන්තිය ප්‍රකාරව මණ්ඩලය විසින් 2010 – 2014 කාල පරිච්ඡේදය දක්වා සංයුක්ත සැලැස්මක් සකස් කර තිබුණද, එය කාලානුරූපව සමාලෝචනය කර යාවත්කාලීන කර නොතිබුණි.

**5.2 <u>ක්‍රියාකාරී සැලැස්ම</u>**

2013 වර්ෂය වෙනුවෙන් මණ්ඩලය විසින් ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර තිබුණද සමාලෝචිත වර්ෂය තුලදී ක්‍රියාත්මක කර තිබුණු දිස්ත්‍රික් මාධ්‍යවේදී වැඩමුළු හා පාසැල් වැඩමුළු පවත්නා ස්ථාන හා කාල වකවානු නිශ්චිත වශයෙන් සඳහන් කර නොතිබුණි.

**5.3 <u>අභ්‍යන්තර විගණනය</u>**

මණ්ඩලයේ අභ්‍යන්තර විගණන කටයුතු අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන අංශය මගින් සිදුකර තිබුණි එසේ වුවත්, 1988 අගෝස්තු 03 දිනැති අංක අයිඒඅයි/98/02 හා 2011 ජනවාරි 25 දිනැති අංක අයිඒඅයි/2011/01 යන භාණ්ඩාගාර චක්‍ර ලේඛ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 13 (5) (ඇ) වගන්තිය ප්‍රකාරව සහ විගණන ප්‍රමිත අංක 610 හි නියමයන්ට අනුව, මණ්ඩලයේ විගණන කටයුතුවලට අදාළ අභ්‍යන්තර විගණන වැඩසටහන් පිළියෙල කිරීම, ක්‍රියාත්මක කිරීම හා වාර්තා කිරීම යන කටයුතු කිසිවක් ඉටුකර නොතිබුණි.

**5.4 <u>විගණන කමිටු</u>**

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී / 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 ඡේදය ප්‍රකාරව, අවම වශයෙන් කාර්තුවකට එක බැගින් විගණන හා කළමණාකරණ කමිටු රැස්වීම් 04 ක් පැවැත්විය යුතු වුවත් සමාලෝචිත වර්ෂය තුළදී රැස්වීම් 02 ක් පමණක් පවත්වා තිබුණි.

**5.5 <u>ප්‍රසම්පාදන සැලැස්ම</u>**

2006 ජනවාරි 25 දිනැති ප්‍රසම්පාදන නියෝජිතායතන චක්‍රලේඛ අංක 08 හි 4.2.1 වගන්තිය ප්‍රකාරව සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් 2013 මැයි 21 දින සකස් කර තිබුණද, එහි වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් ක්‍රියාකාරකම් වලට අදාල භාණ්ඩ හා සේවා මිලදී ගැනීම් ඇතුළත් කර නොතිබුණි. එසේම චක්‍රලේඛයේ 2.14.1 වගන්තිය ප්‍රකාරව, රු.500,000 ට වැඩි භාණ්ඩ හා සේවා මිලදී ගැනිමේදී අවම වශයෙන් මිල ගණන 5 ක් ලබාගත යුතුව තිබුණද අවස්ථා දෙකකදී රු.500,000 වැඩි භාණ්ඩ මිලට ගැනීම සඳහා ආයතන 3 කින් පමණක් මිල ගණන් ලබා ගෙන තිබුණි.

## 5.6 අයවැය ලේඛනමය පාලනය

1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව 2013 වර්ෂය සඳහා අයවැය වාර්තාව 2012 සැප්තැම්බර් 27 දින අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත කර තිබුණි. එසේ වුවත් 2013 වර්ෂයේ මාස 08 ක් ඉක්ම ගිය පසුව 2013 අගෝස්තු මස 29 දින නැවත සංශෝධිත අයවැය වාර්තාවක් පිළියෙළ කර තිබුණි. එම සංශෝධිත අයවැය ලේඛනය හා සත්‍ය වියදම් අතර සියයට 10 සිට සියයට 100 දක්වා පරාසයක විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී මූල්‍ය කළමණාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගී කරගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

## 5.7 රාජ්‍ය ගිණුම්කාරක සභාවේ නියෝග ක්‍රියාත්මක කිරීම.

ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය සම්බන්ධයෙන් 2012 ජූලි 10 දින පවත්වන ලද පොදු ව්‍යාපාර කාරක සභා රැස්වීමේදී ලබාදුන් නියෝග වන, කාර්යාල පරිශ්‍රය රජයේ ගොඩනැගිල්ලක් වෙත ගෙන යෑම, පුවත්පත් කොමසාරිස් තනතුර සඳහා ස්ථිර වශයෙන් පුද්ගලයකු පත් කිරීම, අභ්‍යන්තර විගණනය ක්‍රියාත්මක කිරීම හා විගණනය වෙත වාර්තා ඉදිරිපත් කිරීම, දැනට ආරම්භ කර ඇති පුවත්පත් කියවීම් පිළිබඳ ග්‍රාහක සමීක්ෂණය කඩිනමින් අවසන් කිරීම සහ පුවත්පත් මණ්ඩල පනත සංශෝධනය කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල සංශෝධනයන් ඉදිරිපත් කර එය අනුමත කරවා ගැනීමට කටයුතු කිරීම යන නියෝගයන් ඉටු කර නොතිබුණි.

## 5.8 පාරිසරික හා සමාජ වගකීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මණ්ඩලය ස්ථාපිත කිරීමට අදාල පනතේ 8(3) වගන්තිය අනුව, පුවත්පත් හා පත්‍ර කලාවේදීන් විසින් උසස් පත්‍ර කලාවේදී ආචාරධර්ම පවත්වාගෙන යනු ලබන බවට වගබලා ගැනීම මණ්ඩලයේ ප්‍රධාන අරමුණක් වන අතර, එය සාක්ෂාත් කර ගැනීම සඳහා සකසා තිබුණු කලාවේදීන් විසින් පිළිපැදිය යුතු ආචාරධර්ම පද්ධතිය 1981 න් පසු එනම් පසුගිය අවුරුදු 33 තුලදී වර්තමාන මුද්‍රිත මාධ්‍ය ක්ෂේත්‍රයේ සීඝ්‍ර සංවර්ධනයට සාපේක්ෂව සංශෝධනය කර නොතිබුණි.

(ආ) පුවත්පත් මණ්ඩල පනතේ 25 වගන්තිය ප්‍රකාරව සෑම පුවත්පතක්ම පුවත්පත් මණ්ඩලයේ ලියාපදිංචි කළ යුතු වුවත් ලියාපදිංචි නොවී වෙළඳපළට පුවත්පත් නිකුත්කරන බව පුස්තකාල හා ප්‍රලේඛන මණ්ඩලයේ තොරතුරු අනුව නිරීක්ෂණය විය. එසේ වුවත් එම ලියාපදිංචි නොකළ පුවත්පත් වල පාර්ශවකරුවන් සම්බන්ධව මණ්ඩලයේ කටයුතු වලට බලපාන කරුණක් සේ සලකා අවශ්‍ය නීති රීති සම්පාදනය කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පනතේ 30 වන වගන්තිය ප්‍රකාරව බලය තිබුණද, මේ සඳහා අවශ්‍ය ක්‍රියා මාර්ග ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 06. <u>පද්ධති හා පාලනය</u>

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන දුර්වලතා වරින් වර මණ්ඩලයේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත දැක්වෙන පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

(අ) පාඨමාලා පැවැත්වීම.

(ආ) ප්‍රසම්පාදන කටයුතු.